# ඒල නිව්ස්

## ජනාධිපතිගේ අතේ ප්‍රශ්නයක්

ගිය සතියෙ දවසක එක පාරටම මහ රෑ ඉංදියා අගමැති මන් මෝහන් සිං ජනාධිපති මහින්ද රාජපක්ෂට කතා කලාලු. එහෙම කතා කරල කිව්වලු මිස්ට මහින්ද ඔය ලෙඩේ ගැන මම අපේ දොස්තරවරු එක්කත් කතා කලා, බලාගෙන ඉන්න එපා ඉක්මනට බේත් ටිකක් කරනවා. මොකද ඔයාට මොනව හරි උනෙත් අපි අමාරුවේ කියල. මේක අහපු ජනාධිපති උඩ ගිහින් බිම වැටුනලු. මේ මට කිසිම අමාරුවක් නෑ. මම හොඳ සෞඛ්‍ය තත්ත්වයෙන් ඉන්නේ කියලත් කිව්වලු. ඒ පාර මන් මෝහන් සිං කිව්වලු කොහොම වුනත් හෙට මගේ වෛද්‍යවරු ඇවිත් ඔයාව බලාවි ඒකට ඉඩ දෙන්න කියල. ඔන්න ඉතිං ඊට පහුවදා ම වෛද්‍යවරු පස් දෙනෙක් බඩු මුට්ටුත් උස්සගෙන අරලියගහ මැදුරට ආවලු. ඇවිල්ල ජනාධිපතිත් එක්ක කතා කරාලු. ඒ වෙලාවෙත් ජනාධිපති දිගටම කිව්වත් කිසිම අසනීපයක් නෑ කියල. අන්තිමට දොස්තරවරුන්ගේ ඉල්ලීමට එකඟ වුනාලු. ඊට පස්සේ දොස්තරවරු ජනාධිපතිව ඇඳක හාන්සි කරල උඩුකය නිරුවත් කරල අත් දෙක අරගෙන එහාට මෙහාට නවන්න දිගඅරින්න ගත්තලු. ඒ අතරෙ ඉන්ජෙක්ෂන් ගහනවලු, ප්‍රෙෂර් බලනවලු. මෙහෙම කරන අතරෙ දොස්තරවරු එකිනෙකාගේ මුහුණ බලනවලු. ඔන්න ඉතිං ඔය අතරෙ මන් මෝහන් සිං ගෙන් කෝල් එකක් ආවලු එක දොස්තර කෙනෙකුට. නෑ, නෑ, නෑ සර් කියල. දොස්තර උත්තර දෙනකොට මෙහෙ දෙනව ෆෝන් එක කියල ජනාධිපති ෆෝන් එක අරගෙන මන් මෝහන්ගෙන් ඇහුවලු මොකද්ද මේ නාඩගම, එක්කෙනක්වත් දොඩන්නෙත් නෑ. මක්කැයි ඔහෙල මේ කරන්නේ කියල, ටිකක් තදින් ඇහැව්වලු. ඒ පාර මන් මෝහන් සිං කිව්වලු නෑ අපි පහුගිය කාලෙම ලංකාවේ පත්තර වල දැක්ක ජනාධිපතිගෙ දෑත් ශක්තිමත් කරන්න කියල ඉල්ලල තියෙනව. ඒ වගේම විපක්ෂෙ අය ආණ්ඩුවට එනව ජනාධිපතිගෙ දෑත් ශක්තිමත් කරන්න කියලත් තිබුන කියල කිව්වලු.

## ලේක් හවුසියේ සූබරයෙක්

ලේක් හවුස් එකේ සේවකයන්ට සිය කැමැත්තෙන් වන්දි ලබාගෙන ගෙදර යන්න කියල යෝජනාවක් පසුගිය දවස්වල දම්මලු. ඔන්න ඉතිං මේකෙ ඉදල මොනවත් කරන්න බැහැ කියල හිතපු පිරිසක් අනේ සාදු කියල ඉක්මනට ෆෝම් පුරවල දීල දෙන දෙයක් අරගෙන ගෙදර යන්න සූදානම් වුනාලු. ඉතිං වන්දි ගෙවන දවසෙත් ඒක හරියට ගෙවන්නේ නැතිව පොඩි පොඩි කේස් ටිකක් ගියාලු. කොහොමින් කොහොම හරි වන්දි ලබාගන්න පිරිස ලේක් හවුසියෙන් යන්නට පෙර පුංචි සාදයක් සංවිධානය කලාලු. ඕකට දනට ලේක් හවුසියෙ ඉන්න ප්‍රධානීන්ටත් ආරාධනා කලාලු. ඔන්න ඉතිං තේ පැන් සංග්‍රහය පවත්වන්න ඉස්සෙල්ල පුංචි පුංචි කතා කිපයකුත් තිබ්බලු. මේකෙදි ශ්‍රීමත් ඉන්ද්‍රජිත් ලියනගේත් කතා කරාලු. එයා කිව්වලු ලේක් හවුස් එකේදි මට බොහෝ අය ඇසුරු කරන්න ලැබුනා. ධර්මසිරි ගමගේ වගේ යහපත් සැබෑ මාධ්‍යවේදීන්වත් හමු වුනා. ඒ වගේම මහින්ද අබේසුන්දර වගේ ක්ලාක් වැඩ කරන කුණකටුවොත් හම්බ උනා කියල. ඊට පස්සේ කතා කලේ අබේසුන්දරගෙ කැපිල්ලට ලක් වෙච්ච කෙනෙක්ලු. මිනිහ කිව්වලු මට නම් මේකෙදි හමු වුනේම සූකරයො තමයි කියල. මොකද අනික් එවුන් මහ එවුන්ගෙ වසුරු වළඳද්දී හෙමින් හෙමින් ඒක කලත්, අබේසුන්දර වගේ සූබරයො ඒවා වළඳන්නේ තලු මර මරා කියලත් කිව්වලු.

## රාලහාමි මමත් යන්නම්

මොරටුවෙ කුරුස හංදිය ලඟ ට්‍රැෆික් පොලිසියේ දෙන්නෙක් හිටියලු. ඔන්න ඉතිං ඔය වෙලාවේ හොන්ඩා මේට් එකකින් අවුරුදු පනහක විතර මනුස්සයෙකක් ආවලු. මිනිහ හෙල්මට් දාල හිටියෙ නැහැලු. එයා කුරුස හංදියෙන් මුහුද පැත්තට හැරිල ගෙදරට ටික දුරක් යන්න ඕනලු. ඉතිං මෝටර් බයිසිකලේ ඒ පාරට දාන කොටම පොලිසියෙන් නැවැත්තුවලු. හෙල්මට් නැති නිසා දඩ කොල දෙන්න හදන කොට අර මනුස්සය කිව්වලු මේ පේන දුර මගේ ගේ තියෙන්නෙ. ඒකයි මේ හෙල්මට් නැතිව ආවේ කියල. ඒව හරියන්නෙ නෑ. නීතිය නම් නීතිය. ගන්නව ලයිෂන් ඉන්ෂුවරන්ස් කියල කියන කොටම කළුපාට ඉසුසු ටූපර් එකක් වේගයෙන් ආවලු. ට්‍රැෆික් රාලහාමි මැෂිම එල්ල කරල වාහනේ නවත්තන්න අන කලාලු. ටික දුරක් ඉදිරියට ගිය වාහනේ ඇසිල්ලකින් රිවස් එකේ ඇවිත් රාළහාමි ලඟ නැවැත්තුවලු. එහෙම කරල ෂටර් එක පහත් කරල ඇයි රාළහාමි කියල ඇහැව්වම මහත්තය හයි ස්පීඩ් මේ බලන්න කියල මැෂිමත් පෙන්නල ලැයිෂන් ඉංෂුවරන්ස් දෙන්න කිව්වලු. එතකොට වාහනේ හිටිය කෙනා කිව්වලු රාළහාමි කෝටි ගණන් දීල මේව අරගෙන තියෙන්නේ හයියෙන් යන්න තමයි. මම අහවල් ඇමතිගෙ පුතා දඩ කොලෙත් අරන් ගෙදරට එන්න කියල වාහනේ ස්ටාට් කරන් යන්න ගියාලු. මේක බලාගෙන හිටපු අර අහිංසක මෝටර් සයිකල් කාරයා එහෙනම් සාජන් මහත්තය මමත් යන්නම් නේද කියල යන්න ගියාලු.

## වික්‍රමබාහු මැස්සොත් කනවලු

අබා චිත්‍රපටිය මේ දිනවල දැඩි කතා බහට ලක් වෙමින් තිබෙනවලු. මේ චිත්‍රපටිය ගැන වික්‍රමබාහු කරුණාරත්නත් විවිධ සංවාද මණ්ඩප වල සිය අදහස් දක්වීම් කරමින් යනවලු. ඒ අතරේ පුවත්පත් ගණනාවකට ත් වෙබ් සයිට් කිහිපයකට ත් අබා චිත්‍රපටිය පිළිබඳ විග්‍රහයන් ලියල පලවෙලා තිබුනලු. ඒවායේදී බාහු කියල තියෙන්නේ අබා කුමාරය කියන්නේ දෙමළ ජනතාව අතර හැදුන කෙනෙක් කියලලු. යක්කු කියන්නේ දෙමළ අයට මිසක් සිංහල ආර්යයන් ට නොවේ කියලත් කියල තිබුනලු. ආර්යයන් උදුරාගත්, යටත් කරපු දෙමළ ජනතාවගේ විමුක්තිය වෙනුවෙන් ඔවුන් ද එකතු කර ගනිමින් අබා කුමාරයා සටන් කලා කියල ලු. ඒ නිසා මේ චිත්‍රපටියේ එන සිදුවීම් සමාන කරන්නේ නම් කරන්න වෙන්නේ වන්නියේ ප්‍රභාකරන් ගේ ක්‍රියාකාරීත්වය ට මිසක් දකුණේ මහින්ද රාජපක්ෂගේ වැඩකටයුතු වලට නොවේ කියලත් කියල තිබුනලු. චිත්‍රපටියේ එක තැනකදී අබා කුමාරයා රජ වාසලින් පිටත් කරමින් ඔහුව බලාගන්න භාර දෙමින් කියන්නේ මේ යකුන්ගේ අවසාන ලේ ධාතුව කියල ලු. ඔන්න ඉතිං කොහොම වුනත් මේ පත්තර වලට ලියපු විග්‍රහ අවසන් කරමින් බාහු එක තැනක ලියල තියෙනවලු "....මේ චිත්‍රපටිය මම බලාපොරොත්තු වුන එකක්. මේ වගේ එකක් හදාවි කියල පෙරුම්පුරාගෙන බලාගෙන හිටියෙ. ජැක්සන් ඒ අති ශ්‍රේෂ්ඨ නිර්මාණය කරල තියෙනව. එත් මේකෙ අද්භූතයන්, දේවවාදයන් මතුකරන අවස්ථා තියෙනව. එව මට වැඩක් නෑ. මට රජ බොජුනක් ලැබුනොත් ඒකෙ කූඹියෙක් නෙමේ මැස්සෙක් හිටියත් ඌ අයින් කරල මම රජ බොජුන කනව කියල...." ඔන්න ඉතිං මේ ලියපු ටිකෙන් චිත්‍රපටිය ගැන කරපු විග්‍රහය ගැන ඒව පලවෙච්ච දවසෙ ඉඳල ම දෙස් විදෙස් වලින් විවිධ ප්‍රතිචාර එන්න පටන් ගත්තලු. ඒ එවපු එකක තිබුනලු ".....තමුසේ දෙමළාගේ අයිතිය වෙනුවෙන්, කොටියාගේ අයිතිය වෙනුවෙන් මැස්ස වීසි කරල රජ බොජුන කනව නෙමෙයි, රජ බොජුන වීසි කරල මැස්ස වුනත් කන ජාතියෙ මිනිහෙක් නේ...." කියල.